සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**22 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

# භූගෝල විද්‍යාව II (පාරිසරික භූගෝල විද්‍යාව)
# புவியியல் II (சூழற் புவியியல்)
# Geography II (Environmental Geography)

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ..................................

**අයදුම්කරුවන්ට උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත ය.
- කොටස් දෙකට ම කාලය **පැය තුනකි.**
- I හා II කොටස් **එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා** භාර දෙන්න.

## I කොටස

✻ I කොටසෙහි බහුවරණ ප්‍රශ්න 40 ක් ඇත.
✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. නිවැරදි පිළිතුරකට **එක් ලකුණක්** හිමි වේ.
✻ එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි පිළිතුර තෝරා, එට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**
✻ පිළිතුරු ලිවීම සඳහා **පැන්සල් භාවිත** කිරීම **තහනම්** වේ.

1. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතර පෘථිවිය පිහිටා තිබෙන්නේ
   (1) අඟහරු සහ බ්‍රහස්පති ග්‍රහයන් අතර ය.
   (2) සිකුරු සහ අඟහරු ග්‍රහයන් අතර ය.
   (3) බුධ සහ සිකුරු ග්‍රහයන් අතර ය.
   (4) බ්‍රහස්පති සහ සෙනසුරු ග්‍රහයන් අතර ය. (.........)

2. 'සූර්ය සමීපකය' හා 'සූර්ය දූරකය' පිහිටන දින දෙක පිළිවෙළින් නිවැරදිව සඳහන් වන්නේ පහත දැක්වෙන කවර පිළිතුරෙහි ද?
   (1) ජූනි 4 සහ ජනවාරි 3
   (2) ජනවාරි 3 සහ ජූලි 4
   (3) දෙසැම්බර් 21 සහ සැප්තැම්බර් 21
   (4) ජූලි 4 සහ සැප්තැම්බර් 21 (.........)

3. උත්තරධ්‍රැවයේ දී ජූනි 21 දින දිවා කාලය
   (1) පැය 0 කි. (2) පැය 12 කි. (3) පැය 18 කි. (4) පැය 24 කි. (.........)

4. ඕසෝන් (ozone) ස්ථරය පිහිටා ඇත්තේ
   (1) තාපගෝලයෙහි ය.
   (2) පරිවර්තීගෝලයෙහි ය.
   (3) අපරිවර්තීගෝලයෙහි ය.
   (4) මධ්‍යගෝලයෙහි ය. (.........)

5. සුළං සංසරණය ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක වනුයේ
   (1) පෘථිවි භ්‍රමණය හා පෘථිවිය සූර්යයා දෙසට ඇලව පිහිටීමයි.
   (2) සාගර හා මහාද්වීපවල අසමාන ව්‍යාප්තියයි.
   (3) පීඩන අනුක්‍රමණ බලය හා කෝරියෝලිස් බලයයි.
   (4) ඝර්ෂණය හා පෘථිවි භ්‍රමණයයි. (.........)

6. සංවහන වර්ෂාව ඇතිවීමට අදාළ වලාකුළු වර්ගය වන්නේ
   (1) කෙඳි වලාකුළු ය.
   (2) උච්ච ස්ථර වලාකුළු ය.
   (3) උච්ච කැටි වලාකුළු ය.
   (4) පහළ ස්ථර වලාකුළු ය. (.........)


7. ඇල්බිඩෝව 85% වඩා වැඩියෙන් සිදුවන්නේ
   (1) ජලතලයන්හි ය.
   (2) හිම ආවරණයන්හි ය.
   (3) කාන්තාරවල ය.
   (4) තෙත් බිම්වල ය. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

8. පහත සඳහන් කවර අවධියක් පෙලියෝසොයික යුගයට අයත් වන්නේ ද?
(1) ඔඩොවිසියානු අවධියට ය. (2) ත්‍රියාසික අවධියට ය.
(3) තෘතියික අවධියට ය. (4) ක්‍රිටේසියානු අවධියට ය. (.........)

9. ආග්නේය පාෂාණ වර්ග දෙකක් වන්නේ
(1) ග්‍රැනයිට් සහ නයිස් ය. (2) ග්‍රැනයිට් සහ බැසෝල්ට් ය.
(3) බැසෝල්ට් සහ ඩොලමයිට් ය. (4) ගැබ්රෝ සහ ක්වෝට්ස් ය. (.........)

10. පහත සඳහන් රූප සටහනෙන් සුළං පීඩන පද්ධතියක් පෙන්නුම් කෙරෙයි.
මතු සඳහන් කවර පිළිතුරකින් එය නිවැරදිව දක්වේ ද?
(1) උත්තරාර්ධගෝලයේ වාසුළියකි.
(2) දක්ෂිණාර්ධගෝලයේ වාසුළියකි.
(3) උත්තරාර්ධගෝලයේ පිළිවාසුළියකි.
(4) දක්ෂිණාර්ධගෝලයේ පිළිවාසුළියකි. (.........)




11. කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයෙහි 'C' අක්ෂරයෙන් දක්වෙන්නේ
(1) නිවර්තන දේශගුණයයි. (2) උණුසුම් සෞම්‍ය දේශගුණයයි.
(3) වියළි දේශගුණයයි. (4) ධ්‍රැවක දේශගුණයයි. (.........)

12. අන්තර් නිවර්තන අභිසරණ කලාපය (ITCZ) යනු
(1) නිවර්තන කලාපයේ ස්ථාවර වැඩි පීඩන මණ්ඩලයකි.
(2) ඉහළ අක්ෂාංශවල සිට උප නිවර්තන කලාපය වෙත ගමන් කරන අඩුපීඩන තීරුවකි.
(3) නිවර්තන කලාපය තුළ කාලීනව දෝලනය වන අඩු පීඩන කලාපයකි.
(4) උණුසුම් හා ශීත වායු ස්කන්ධ මුණගැසෙන පෙරමුණු කලාපයකි. (.........)

13. කැරිබියන් සහ චීන මුහුදුවල හටගන්නා නිවර්තන වාසුළි පිළිවෙළින් හඳුන්වනු ලබනුයේ
(1) ටයිෆුන් සහ විලිවිලිස් යනුවෙනි.
(2) හරිකේන් සහ ටයිෆුන් යනුවෙනි.
(3) ටෝර්නාඩෝ සහ හරිකේන් යනුවෙනි.
(4) ටයිෆුන් සහ ටෝර්නාඩෝ යනුවෙනි. (.........)

14. පෙල්ස්පාර් ඛනිජය මැටි බවට පත්වීමේ ක්‍රියාවලිය විස්තර කරනුයේ
(1) භෞතික ජීර්ණය යනුවෙනි. (2) රසායනික ජීර්ණය යනුවෙනි.
(3) යාන්ත්‍රික ජීර්ණය යනුවෙනි. (4) ඓන්ද්‍රිය ජීර්ණය යනුවෙනි. (.........)

15. 'සැවනා බියෝම්' ව්‍යාප්තව ඇති මහාද්වීප තුන නිවැරදිව නම් කර ඇත්තේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
(1) උතුරු ඇමෙරිකාව, අප්‍රිකාව සහ ආසියාව
(2) දකුණු ඇමෙරිකාව, අප්‍රිකාව සහ ඕස්ට්‍රේලියාව
(3) අප්‍රිකාව, උතුරු ඇමෙරිකාව සහ යුරෝපය
(4) ආසියාව, යුරෝපය සහ උතුරු ඇමෙරිකාව (.........)

16. පහත සඳහන් ක්‍රියාවලින් අතුරින් වඩාත්ම සීඝ්‍ර වනුයේ කවරක් ද?
(1) මඩගලනය (2) ගිලාබැසීම
(3) රූරායාම (4) හිමධාව (.........)


17. හයිටි සහ චිලී යන රටවල් හා සම්බන්ධ භූකාරක තැටි පිළිවෙළින් නිවැරදිව හඳුනාගත හැක්කේ පහත සඳහන් කවර පිළිතුරක ද?
(1) ඇන්ටාක්ටික් තැටිය සහ උතුරු ඇමෙරිකානු තැටිය
(2) පැසිපික් තැටිය සහ උතුරු ඇමෙරිකානු තැටිය
(3) කැරිබියානු තැටිය සහ දකුණු ඇමෙරිකානු තැටිය
(4) නැස්කා තැටිය සහ ඇන්ටාක්ටික් තැටිය (.........)

18. සමුද්‍රස්ථ අගාධ වැඩිම සංඛ්‍යාවක් පවතින්නේ පහත සඳහන් කවර සාගරයක ද?
(1) උතුරු පැසිපික් සාගරයේ ය. (2) දකුණු පැසිපික් සාගරයේ ය.
(3) උතුරු අත්ලාන්තික් සාගරයේ ය. (4) දකුණු අත්ලාන්තික් සාගරයේ ය. (.........)

The National e-learning Portal for The General Education


[ තුන්වෙනි පිටුව බලන්න.

19. A, B, C වශයෙන් නම් කර ඇති නැමි වර්ග තුනක් පහත රූප සටහනින් දක්වේ. එම නැමි නිවැරදි අනුපිළිවෙළින් දක්වෙන්නේ කවර ප්‍රකාශයෙහි ද?




(1) A ඔත් නැම්ම B අසමමිතික නැම්ම C ඒකානති නැම්ම
(2) A අසමමිතික නැම්ම B ඒකානති නැම්ම C ඔත් නැම්ම
(3) A ඔත් නැම්ම B ඒකානති නැම්ම C අසමමිතික නැම්ම
(4) A ඒකානති නැම්ම B ඔත් නැම්ම C අසමමිතික නැම්ම (.........)

20. පහත සඳහන් රූප සටහනෙහි A සහ B වශයෙන් වෙරළ භූ ලක්ෂණ දෙකක් පෙන්නුම් කර තිබේ. මෙම අක්ෂරවලින් දක්වෙන්නේ
(1) A තුඩුව සහ B මුහුදු කුළ ය.
(2) A තුඩුව සහ B වෙරළ ය.
(3) A මුහුදු කුළ සහ B මොහොර ය.
(4) A මුහුදු ආරුක්කුව සහ B මුහුදු කුළ ය.




(.........)


21. භූ රූපය සහ ඊට අදාළ ක්‍රියාවලිය සඳහන් වනුයේ පහත සඳහන් කවර පිළිතුරක ද?
(1) හිරිලඹය සහ ගංගාව (2) සර්කය සහ සුළඟ
(3) බහඩා සහ තරංගය (4) ගල්වන සහ ගංගාව (.........)

22. A, B, C වශයෙන් භූ රූපණ තුනක් සහ D E F වශයෙන් ඒවාට සම්බන්ධ ක්‍රියාවලි තුනක් පහතින් දක්වේ.

A ඩ්‍රම්ලින D ගැලැසියර්
B ලම්භනිම්න E ග්ලැසියර
C යාඩැං F සුළඟ

නිවැරදි සම්බන්ධතාව දක්වෙන පිළිතුර තෝරන්න.
(1) AE BD CF (2) AD BF CE (3) AF BF CE (4) AE BF CD (.........)

23. පහත සඳහන් රූපසටහනෙහි A, B, C සහ D අතුරින් 'වැඩිම ජලය සහිත ළිඳ' සහ 'වියළි ළිඳ' නිවැරදිව දක්වෙන පිළිතුර කුමක් ද?




(1) A සහ B (2) B සහ D (3) A සහ C (4) A සහ D (.........)

25851

24. පාංශු පැතිකඩක් යනු
(1) පරීක්ෂණයක් සඳහා ගනු ලබන පාංශු නියැදියකි.
(2) පසෙහි ව්‍යුහය සහ වයනය පෙන්නුම් කරන ආකෘතියකි.
(3) පසෙහි ඉහළ සිට පහළට පාංශු ස්තර දැක්වීමකි.
(4) පසෙහි ජල අන්තර්ගතය පරීක්ෂාව සඳහා සිදුකරනු ලබන කැනීමකි. (.........)

25. ශ්‍රී ලංකාවේ 'සදහරිත වියළි වනාන්තර' වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති පාංශු කලාපය නිවැරදිව දැක්වෙන්නේ කුමන පිළිතුරක ද?
(1) රතු-කහ පොඩ්සොලික් පස
(2) රතු-දුඹුරු පස
(3) චූර්ණමය නොවන දුඹුරු පස
(4) රතු-කහ ලැටසොල්ස් පස (.........)

26. ජෛව භූ රසායන චක්‍රයේ ක්‍රියාකාරිත්වය යනු
(1) ජීවීන්ට අවශ්‍ය මූලාංග ජල ගෝලය හා ජෛව ගෝලය අතර හුවමාරු වීම
(2) ශිලා ගෝලය, ජල ගෝලය, වායු ගෝලය සහ ජෛව ගෝලය අතර මූලාංග සංසරණය වීම
(3) ජල ගෝලය සහ වායු ගෝලය අතර රසායනික සංයෝග හුවමාරු වීම
(4) ජල ගෝලය සහ ශිලා ගෝලය අතර රසායනික සංයෝග හුවමාරු වීම (.........)

27. අම්ල වැසි ඇතිකරන ප්‍රධාන වායු වර්ග දෙක වනුයේ
(1) කාබන්ඩයොක්සයිඩ් සහ හයිඩ්‍රජන් ය.
(2) සල්ෆර්ඩයොක්සයිඩ් සහ නයිට්‍රජන් ඔක්සයිඩ් ය.
(3) කාබන්ඩයොක්සයිඩ් සහ ඔක්සිජන් ය.
(4) සල්ෆර් ඩයොක්සයිඩ් සහ හයිඩ්‍රජන් ය. (.........)

28. නාගරික ප්‍රදේශවල වායුගෝලීය දූෂකයන්හි නම් සඳහන් වන්නේ පහත සඳහන් කවර යුගලයෙහි ද?
(1) එරොසොල්ස් සහ නයිට්‍රජන්
(2) කෘමිනාශක සහ වල්නාශක
(3) එරොසොල්ස් සහ කාබන් මොනොක්සයිඩ්
(4) හීලියම් සහ දූවිලි (.........)

29. ශ්‍රී ලංකාවේ පහත සඳහන් ඛනිජ වර්ග ව්‍යාප්තව ඇති ස්ථාන නිවැරදි පිළිවෙළින් දැක්වෙන්නේ කුමන වගන්තියෙන් ද?
**සිලිකා වැලි, ඇපටයිට්, ලිමොනයිට්, මිනිරන්**
(1) නාත්තන්ඩිය, එප්පාවල, බද්දේගම, කහවත්ත
(2) මාරවිල, එප්පාවල, බලංගොඩ, බෝගල
(3) බංගදෙනිය, මුතුරාජවෙල, බලංගොඩ, බෝගල
(4) බෝගල, නාත්තන්ඩිය, කහවත්ත, බලංගොඩ (.........)

30. වර්ෂ 2000 සිට ලෝකයේ වන හරණය නොකඩවා සිදුවන ප්‍රදේශ දෙකක් දැක්වෙන්නේ පහත සඳහන් කුමන පිළිතුරේ ද?
(1) අප්‍රිකානු උපසහරා ප්‍රදේශ සහ ලතින් ඇමෙරිකාව
(2) ලතින් ඇමෙරිකාව සහ අග්නිදිග ආසියාව
(3) දකුණු ආසියාව සහ බටහිර ආසියාව
(4) කැරිබියන් දූපත් සහ දකුණු ආසියාව (.........)

31. පහත සඳහන් පිළිතුරු අතරින් ශ්‍රී ලංකාවේ වැදගත් උද්භිද උද්‍යාන තුනෙහි පිහිටීම නිවැරදිව දැක්වෙන්නේ කවර පිළිතුරෙහි ද?
(1) පේරාදෙණිය - කෑගල්ල, හෙනරත්ගොඩ - මාතලේ, හග්ගල - මහනුවර
(2) පේරාදෙණිය - මහනුවර, හෙනරත්ගොඩ - ගම්පහ, හග්ගල - නුවරඑළිය
(3) පේරාදෙණිය - මාතලේ, හෙනරත්ගොඩ - කොළඹ, හග්ගල - මහනුවර
(4) පේරාදෙණිය - කෑගල්ල, හෙනරත්ගොඩ - රත්නපුරය, හග්ගල - බදුල්ල (.........)

32. ශ්‍රී ලංකාවේ උප කඳුකර වනාන්තර තිබෙන ප්‍රමුඛ දිස්ත්‍රික්ක තුන දක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
(1) නුවරඑළිය, රත්නපුරය සහ කුරුණෑගල
(2) නුවරඑළිය, මාතලේ සහ මහනුවර
(3) රත්නපුරය, කෑගල්ල සහ බදුල්ල
(4) මාතලේ, මහනුවර සහ බදුල්ල (.........)


33. ශ්‍රී ලංකාවේ දේශගුණික වශයෙන් අන්තර් කලාපයේ පිහිටා ඇති නගර දෙකක් නිවැරදිව සඳහන් වන්නේ කවර පිළිතුරෙහි ද?
(1) ගාල්ල, රත්නපුර
(2) කුරුණෑගල, බදුල්ල
(3) මොණරාගල, හම්බන්තොට
(4) රත්නපුර, කළුතර (.........)

34. පහත සඳහන් කවර පිළිතුරකින් කලපු සහ ඒවා පිහිටි දිස්ත්‍රික්ක නිවැරදිව දක්වේ ද?
(1) කෝකිලායි (මුලතිව්) රැකව (හම්බන්තොට) ආරුගම් (අම්පාර)
(2) කෝකිලායි (අම්පාර) රැකව (හම්බන්තොට) ආරුගම් (මඩකලපුව)
(3) කෝකිලායි (පුත්තලම) රැකව (අම්පාර) ආරුගම් (මඩකලපුව)
(4) කෝකිලායි (මඩකලපුව) රැකව (ගාල්ල) ආරුගම් (හම්බන්තොට) (.........)

35. ශ්‍රී ලංකාවේ 'තෙත් පතන තෘණ භූමි' තිබෙන ප්‍රදේශ දෙකක් නිවැරදිව සඳහන් වන්නේ පහත සඳහන් කවර පිළිතුරක ද?
(1) ඌව ද්‍රෝණිය සහ හෝර්ටන් තැන්න
(2) හෝර්ටන් තැන්න සහ එල්ක් තැන්න
(3) නකල්ස් වැටි සහ ඌව ද්‍රෝණිය
(4) එල්ක් තැන්න සහ නකල්ස් වැටි (.........)

36. වඩාත් සාර්ථක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා **ඉතා වැදගත්** අවශ්‍යතා තුන සඳහන් වන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
   (1) අපතේ යාම අඩු කිරීම, ජනගහන පාලනය සහ අධ්‍යාපනය.
   (2) අපතේ යාම අඩු කිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ නැවත භාවිතය.
   (3) තොරතුරු තාක්ෂණය, ප්‍රතිචක්‍රීකරණය සහ පාරිසරික නීති පැනවීම
   (4) ප්‍රතිචක්‍රීයකරණය, දුප්පත්කම තුරන් කිරීම සහ මහජනතාව දැනුවත් කිරීම (.........)

37. ශ්‍රී ලංකාවේ සිතියමෙහි *A, B, C, D* සහ *E* යනුවෙන් සටහන් කර ඇති කඳුවැටිවල නිවැරදි පිහිටීම සඳහන් වන්නේ පහත දක්වෙන කවර පිළිතුරෙහි ද?




| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | *A* නකල්ස් | *B* පිදුරුතලාගල | *C* සමනල | *D* රක්වාන | *E* නමුනුකුල |
| (2) | *A* නමුනුකුල | *B* නකල්ස් | *C* පිදුරුතලාගල | *D* සමනල | *E* රක්වාන |
| (3) | *A* නකල්ස් | *B* පිදුරුතලාගල | *C* නමුනුකුල | *D* සමනල | *E* රක්වාන |
| (4) | *A* පිදුරුතලාගල | *B* නකල්ස් | *C* සමනල | *D* නමුනුකුල | *E* රක්වාන (.........) |

38. 1987 මොන්ට්‍රියල් සම්මුතියෙහි ප්‍රධාන අරමුණ වන්නේ
   (1) වනහරණය වැළැක් වීම
   (2) ඕසෝන් ස්ථරයේ ක්ෂයවීම අවම කිරීම
   (3) ලෝක ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම
   (4) තෙත් බිම් පරිසර පද්ධති ආරක්ෂා කිරීම (.........)

39. පරිසර සංරක්ෂණ ආචාරධර්ම සුරැකීමේලා මූලික වශයෙන් දායකවන්නේ පහත සඳහන් කවර සංකල්පයක් ද?
   (1) නියතිවාදී සංකල්පය
   (2) ආගමික සංකල්පය
   (3) ශක්‍යවාදී සංකල්පය
   (4) උපයෝගිතාවාදී සංකල්පය (.........)

40. සෑම වර්ෂයකම **ජුනි 5** දින සමරනු ලබන්නේ පහත සඳහන් කවර සිද්ධියක් ද?
   (1) ලෝක පෘථිවි දිනයයි.
   (2) ලෝක ඕසෝන් දිනයයි.
   (3) ලෝක ජල දිනයයි.
   (4) ලෝක පරිසර දිනයයි. (.........)

* *

The National e-learning Portal for The General Education

25851



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**22 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

**භූගෝල විද්‍යාව II (පාරිසරික භූගෝල විද්‍යාව) (II කොටස)**
**புவியியல் II (சூழற் புவியியல்) (பகுதி II)**
**Geography II (Environmental Geography) (Part II)**

**අයදුම්කරුවන්ට උපදෙස්:**

* **එක් කොටසකින් ප්‍රශ්න දෙක** බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* ලෝක සිතියමක්, අප්‍රිකාවේ සිතියමක් සහ ශ්‍රී ලංකාවේ සිතියම් **දෙකක්** සපයා ඇත.

**'අ' කොටස - පරිසරයේ මූලිකාංග**

**1.** (i) සපයා ඇති අංක 1 දරණ අප්‍රිකාවේ සිතියමේ කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයෙහි ප්‍රධාන දේශගුණ කාණ්ඩයක් සහ එහි උප බෙදීම් දක්වා ඇත. ඒවා හඳුනාගෙන සපයා ඇති සිතියමෙහි නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) අංක 1 යටතේ ඔබ හඳුනාගත් උප බෙදීම්වල කැපී පෙනෙන භෞතික ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) මෙම උප බෙදීම් පවතින ප්‍රදේශවල මානුෂ කටයුතු කෙරෙහි දේශගුණය බලපාන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) භෞතික ලක්ෂණ දක්වෙන යුගල **තුනක්** පහත සඳහන්වේ. එක් එක් යුගලයක දක්වෙන ලක්ෂණ **දෙක** අතර වෙනස්කම් රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) පාදක ගැලීම් සහ මතුපිට අධිද්‍රවිතය
(ආ) ප්‍රථම ගංගාව සහ අපර ගංගාව
(ඉ) පිටාර තැන්න සහ ඩෙල්ටාව
(ලකුණු 06 යි.)

(ii) ගඟක පතුල් භාරය පරිවහනය කෙරෙන ප්‍රධාන විධි **තුන** රූප සටහනක දක්වා ඒවා නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) පතුල් භාරය මගින් ගංගා බාදනය සිදුවන ආකාරය පැහැදිලි ලෙස විස්තර කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) සපයා ඇති ලෝක සිතියමෙහි යමහල් කලාපවල ගෝලීය ව්‍යාප්තිය ලකුණු කරන්න. (ලකුණු 02 යි.)

(ii) මෙම ව්‍යාප්ති රටාවට හේතු විභාග කරන්න. (ලකුණු 05 යි.)

(iii) යමහල් භූ රූප **හතරක්** තෝරාගෙන ඒවායේ නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**4.** (i) වෙරළක ප්‍රධාන බෙදීම් දක්වෙන හරස්කඩක් ඇඳ ඒවා නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) තරංග ක්‍රියාකාරිත්වය මගින් ඇතිවන බාදිත ලක්ෂණ **දෙකක්** රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iii) තරංග ක්‍රියාවලිය මගින් බිහිවන නිධිසාදිත භූ රූප **හතරක** නිර්මාණ ක්‍රියාවලි රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**'ආ' කොටස - පරිසර කළමනාකරණය සහ සංරක්ෂණය**

**5.** (i) සපයා ඇති ශ්‍රී ලංකාවේ සිතියමෙහි රක්ෂිත වනාන්තර **තුනක්** සේයා කර නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ශ්‍රී ලංකාවේ ජාතික වන ප්‍රතිපත්තියෙහි අරමුණු **තුනක්** සඳහන් කොට එම අරමුණු ශ්‍රී ලංකාවට වැදගත්වන්නේ කෙසේ දැයි සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) ශ්‍රී ලංකාවේ රජයට, වනාන්තර ආරක්ෂා කිරීමේ දී මුහුණ පෑමට සිදුවන අභියෝග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

[ හත්වෙනි පිටුව බලන්න.

**6.** (i) "සංරක්ෂණ ගොවිතැන" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) ශ්‍රී ලංකාවේ සංරක්ෂණ ගොවිතැනේ දී භාවිත වන ක්‍රම ශිල්ප **තුනක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 03 යි.)

(iii) ශ්‍රී ලංකාවේ සංරක්ෂණ ගොවිතැනේ දී මුහුණ දීමට සිදුවන භෞතික සංරෝධක **දෙකක්** හා මානව සංරෝධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

**7.** (i) සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි වාර්ෂික ජල ගැලීම්වලට ගොදුරුවන ප්‍රධාන ගංගා **තුනක්** ලකුණු කොට නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) නිශ්චිත උදාහරණ සපයමින්, මෙම ගංගා ද්‍රෝණිවල ජල ගැලීම් මගින් මානව පරිසරය කෙරෙහි ඇති කරන බලපෑම් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) ඔබ විසින් හඳුනාගන්නා ලද ගංගා ද්‍රෝණිවල ගංවතුර පාලනය කිරීම සඳහා භාවිත කර ඇති විධි **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

**8.** පරිසර කළමනාකරණයේ දී ලෝකයේ අවධානයට යොමු වී ඇති පාරිසරික ගැටලු **පහක්** පහත දැක්වේ.

1. වන හරණය
2. ලවණීකරණය
3. තෙත් බිම් පරිසර පද්ධති විනාශය
4. වායු දූෂණය
5. ජෛව විවිධත්වය විනාශ වීම

ඉහත ලැයිස්තුව ඇසුරෙන් මතු දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) **අංක 1 සහ අංක 2** හි සඳහන් පාරිසරික ගැටලු බරපතල ලෙස පවත්නා ලෝක කලාප සඳහා උදාහරණ **දෙක** බැගින් සපයමින් එවැනි ගැටලු ඇතිවීමට බලපා ඇති හේතු පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි.)

(ii) තෙත් බිම් පාරිසරික පද්ධති ආරක්ෂණයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(iii) **අංක 4 සහ 5** ට අදාළ පාරිසරික ගැටලු කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කර ඇති උපාය මාර්ග පරීක්ෂා කරන්න. (ලකුණු 05 යි.)

The National e-learning Portal for The General Education

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved*]

25751

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**


**22 | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

භූගෝල විද්‍යාව II (පාරිසරික භූගෝල විද්‍යාව)
புவியியல் II (சூழற் புவியியல்)
**Geography II (Environmental Geography)**

ප්‍රශ්න අංකය / வினா இல / **Question No.** } **1**

විභාග අංකය / சுட்டெண் / **Index No.** } ..............................



මෙතැනින් වෙන් කරන්න / இங்கே வெட்டி அகற்றவும் / detach here

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


**22 II**

ප්‍රශ්න අංකය / வினா இல / **Question No.** 3

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2010**

විභාග අංකය / சுட்டெண் / **Index No.** ..........................


භූගෝල විද්‍යාව II (පාරිසරික භූගෝල විද්‍යාව) (II කොටස)
புவியியல் II (சூழற் புவியியல்) (பகுதி II)
**Geography II (Environmental Geography) (Part II)**



මෙතැනින් වෙන් කරන්න / இங்கே வெட்டி அகற்றவும் / detach here

**22** { භූගෝල විද්‍යාව II (පාරිසරික භූගෝල විද්‍යාව) (II කොටස)
புவியியல் II (சூழற் புவியியல்) (பகுதி II)
Geography II (Environmental Geography) (Part II)

ප්‍රශ්න අංකය / வினா இல / Question No. } **5** විභාග අංකය / சுட்டெண் / Index No. } ..................



ප්‍රශ්න අංකය / வினா இல / Question No. } **7** විභාග අංකය / சுட்டெண் / Index No. } ..................

